**ගලිගමුව ප්‍රාදේශීය සභාව**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මැයි 15 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 23 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 20 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ගලිගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති රු.215,714 ක් වූ බැරකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි දක්වා නොතිබුණි. | බැරකම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අතපසුවීමකින් කිරීමට නොහැකි වී ඇති අතර එම අඩුපාඩු නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි ශේෂය රු. 148,426 ක් අඩුවෙන් දැක්වුණි. | ජංගම නොවන වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | අදාල ගැලපීම් සිදුකර නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ රු. 55,677 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2019 වර්ෂයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඈ) | 2018 වර්ෂයේ මුද්දර ගාස්තු උපලේඛණ සකස් කිරීම වෙනුවෙන් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට ගෙවිය යුතු රු. 144,100 ක් සඳහා ණයහිමි වෙන්කිරීම් සිදුකර නොතිබුණි. | ඉකුත් වර්ෂයට අදාල ණයහිමි වෙන් කිරීම් ගිණුම්ගත කළ යුතුය. | 2018 වර්ෂයේ මුද්දර ගාස්තු වෙනුවෙන් ඉඩම් රෙජිස්ටාර් කාර්යාලයට ගෙවිය යුතු රු.144,100 ක මුදල 2020 වර්ෂයේ නිවැරදි කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 571 | 2010 සිට 2017 වර්ෂය දක්වා කාලයට අදාළ රු.743,292 ක තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | කර්මාන්ත සඳහා ලැබුණු මුදල් රු.726,978 මුදල් ප්‍රදානය කළ ආයතනය වෙත නැවත ගෙවීම් කිරීමට විමසීම් කර ඇති බව දන්වමි. |
| (ii) මුදල් රෙගුලාසි 1646 | සභාව සතු වාහන 08 ක ධාවන සටහන් 2015 ඔක්තෝබර් සිට විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. | QU-1076 ත්‍රී රෝද රථය හා 2013 වර්ෂයේ සිට මේදක්වා ලබා නොදුන් ඉතිරි වාහන වල ධාවන සටහන් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 07 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | HP-3986 ට්‍රැක්ටරය සඳහා ඉදිරියේදී ඉන්ධන පරික්ෂාව සිදු කරන බවත් අනෙක් වාහන 05 හි ඉන්ධන පරීක්ෂාව සිදු කිරීමට කටයුතු කරනු ලබන බවත් දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,333,270 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 12,470,437 ක් විය.

## 2.2. මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2010 වර්ෂයේ සිට අක්‍රීයව පවතින රු. 46,582 ක බැංකු ගිණුම් ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | අක්‍රිය බැංකු ගිණුම නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතින බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | 2019 බිල්කල ආදායම | 2019 රැස් කල ආදායම | 2019 දෙසැම්බර් 31 දිනට හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල්කල ආදායම | 2018 රැස් කල ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට හිඟය |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,501,240 | 2,633,578 | 2,669,017 | 368,035 | 2,461,368 | 2,391,123 | 2,276,462 | 488,169 |
| කුලී | 5,096,085 | 4,231,854 | 3,734,038 | 542,821 | 5,614,245 | 5,003,541 | 2,923,622 | 525,146 |
| බලපත්‍ර ගාස්තු | 1,200,050 | 1,277,782 | 1,296,332 | - | 900,200 | 900,200 | 1,158,566 | 22,250 |
| වෙනත් ආදායම් | 17,520,074 | 23,278,832 | 40,494,287 | 154,073,493 | 15,093,034 | 15,193,034 | 15,048,029 | - |

### 2.3.2 වරිපනම් බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට අයවිය යුතු වරිපනම් බදු ශේෂය රු.1,598,504 ක් වූ අතර, හිඟ අයකර ගැනීම් සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. වරිපනම් බදු අයකිරීමේ කාර්යය සඳහා සභා බල ප්‍රදේශය තුල පිහිටි දේපල වසර 05 කට වරක් තක්සේරු කල යුතු වුවද, 2009 වර්ෂයට පසුව දේපල තක්සේරු කර නොතිබුණි. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | වරිපනම් බදු හා අක්කර බදු උපරිමය අය කර ගැනීමට කටයුතු කල බවත් වරිපනම් බදු නව තක්සේරුවක් සිදු කිරීමට කටයුතු කර ඇති බවත් දන්වමි. |

2.3.3 කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| කොටියාකුඹුර ගවමස් කඩයෙන් 2014 වර්ෂයේ සිට ලැබිය යුතු රු. 525,146 ක් අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන තිබුණද, බදුකරු සතුව වත්කම් නොමැති වීම හේතුවෙන් නඩු තීන්දුව ප්‍රකාරව හිඟ අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | අධිකරණ නියෝගයක් ලබා ගැනීමට කටයුතු කළ යුතුය. | නඩු තීන්දුව අනුව මුදල් අයකර ගත යුතු වුවත් ඔහු සතුව වත්කම් නොමැති බවට අධිකරණයට වාර්තා කර ඇත. |

2.3.4 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත 32 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. එම හේතුවෙන් රු. 128,000 ක ආදායමක් සභාවට අහිමි වී තිබූ අතර, අදාල කර්මාන්ත තුලින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් ද සිදුව නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගත යුතු සියලු ආයතන වෙත විධිමත්ව බලපත්‍ර නිකුත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. | ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර බලපත්‍ර ලබා නොගත් සියලු කර්මාන්ත සඳහා බලපත්‍ර ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,819,325 ක් හා මුද්දර ගාස්තු රු. 20,716,866 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | 2019 මාර්තු මාසය දක්වා මුද්දර ගාස්තු ලැබී ඇති බවත් ඉතිරි මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරමින් පවතින බවත් දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණයවූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් පුස්තකාල කළමනාකරණය වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථාවක් පනවාගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පැනවීම සිදු කළ යුතුය. | සභාව විසින් අනෙකුත් අංශ වලට අදාල අතුරු ව්‍යවස්ථා 16 ක් සකස් කර එහි ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව දන්වමි. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් නොමැති බැවින් සේවාදායකයන්ට ගලි සේවාව ලබා ගැනීමට ඇති අවස්ථාව අහිමිවී තිබුණි. | ගලි සේවාව ලබා දිය හැකි පරිදි ඉඩ පහසුකම් ලබා ගත යුතුය. | ඉදිරියේදී ප්‍රමාණවත් ඉඩකඩ ලබාගෙන මහජනතාවට ගලි සේවාව සැපයීමට කටයුතු කරමි. |

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභා ප්‍රධාන අමාත්‍යාංශ ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කල කර්මාන්ත සඳහා 2014 වර්ෂය තුල අවස්ථා දෙකකදී ලැබී තිබුණු රු. 726,978 ක් අදාල කර්මාන්ත නිසි ලෙස අවසන් කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | ලැබුණ ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජන ගෙන අදාල කර්මාන්ත නිසි ලෙස අවසන් කළ යුතු වීම. | රු.726,978 ක මුදල අදාල ආයතනයට ආපසු යැවීමට විමසීම් කර ඇති බවත්, රු.187,195 ක් ආදායමට ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 වත්කම් ලේඛනගත නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ඉඩම් ගොඩනැගිලි හා ඒවායේ වටිනාකම් හඳුනාගෙන ලේඛනගත කර නොතිබුණි. | සභාව සතු සියලු වත්කම් ලේඛනගත කළ යුතුය. | වත්කම් හදුනා ගැනීම හා ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.3.2 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ලියාපදිංචි අයිතිය නොමැතිව සභාව විසින් පරිහරණය කරනු ලබන වාහනයක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. | පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

3.3.3 නඩත්තු හා අළුත්වැඩියා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2014 වර්ෂය හා ඊට පෙර සිට ධාවනයෙන් ඉවත් කර තිබූ වටිනාකම රු. 540,900 ක් වූ ට්‍රැක්ටර් 02 ක් හා යතුරු පැදියක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ විධිමත්ව අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල කටයුතු කඩිනම් කළ යුතුය. | මෝටර් රථ පරීක්ෂක වෙත යොමුකර ලැබෙන නිර්දේශ මත අවශ්‍ය තීරණ ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. |

3.4 ප්‍රසම්පාදනය

3.4.1 ප්‍රසම්පාදනය සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු. 9,055,727 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු කල යුතුය. | 2020 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇති බව දන්වමි. |